PMoE
Sabaragamuwa

සබරගමුව පළාත් සභාව - சப்ரகமுவமாகாணசபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்விதகவல்தொழில்நுட்பம்மற்றும்கலாச்சாரநடவடிக்கைகளுக்கானஅமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary
Office – 045 2223015 Residence – 045 2232985
Mobile – 071 4402000
Email – msweerasooriya@gmail.com

කාර්යාලය / Office
නවනගරය,රත්නපුර.
Newtown, Rathnapura.
Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number } ME/E/13/ 2019 -අ.ව.

ඔබේ අංකය / உமது இல / Your Number }

දිනය / திகதி / Date } 2019/04/03

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ
අංක - සබර/2019/03

සබරගමුව පළාතේ සියලුම පාසල් වල විදුහල්පතිවරුන් වෙත,

**<u>පාසල් දරුවන් විවිධ උත්සව හා වැඩසටහන් සඳහා සහභාගි කරවා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග</u>**

මෙම පළාතේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආයතන වල පැවැත්වෙන උත්සව/වැඩසටහන් සඳහා පාසල් දරුවන් සහභාගි කරවා ගැනීම නිරන්තරයෙන් සිදු වේ.තූර්ය වාදක කණ්ඩායම් ලෙස,නැටුම් කණ්ඩායම් ලෙස හා සම්මන්ත්‍රණ සඳහා වන විවිධ වැඩසටහන් සඳහා පාසල් දරුවන් සහභාගි කරවා ගනී.

මෙලෙස සහභාගි වන දරුවන්ට විවිධ අපහසුතා වලට ලක් වීමට සිදුවන බව ගුරුවරුන්ගේ හා දෙමාපියන්ගේ නිරන්තර පැමිණිලි ලැබේ.

එබැවින් පහත කොන්දේසි වලට යටත්ව පමණක් පාසල් දරුවන් සහභාගි කරවීමට කටයුතු කළ යුතු බවට අවධාරණය කරමි.

1. පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට කිසිදු බාධාවක් නොවිය යුතුය.
2. සහභාගි කරවා ගන්නා සියලුම පාසල් දරුවන්ගේ ආරක්ෂාව ප්‍රවාහන පහසුකම් හා ආහාරපාන ලබාදීම අනිවාර්යයෙන්ම සහභාගි කරවා ගන්නා ආයතනය විසින් දැරිය යුතුය.
3. ඉහත කොන්දේසි වලට යටත්ව කටයුතු කරන බවට පාසල් සිසුන් සම්බන්ධ කර ගන්නා කාර්යයට අදාල ආයතන ප්‍රධානියා විසින් ලබා දෙන සහතිකය මත පමණක් පාසල් සිසුන් සම්බන්ධ කළ යුතුය.
4. ඒ අනුව ඔබගේ එකඟතාවය මත කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතියක් ලබා ගෙන පාසල් දරුවන් සහභාගි කරවීමට අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගත යුතුය.

මහින්ද එස්.වීරසූරිය.
ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

Ministry of Provincial Education
Sabaragamuwa

පිටපත්:-

1. ප්‍රධාන ලේකම්,සබරගමුව පළාත. - කරු. දැ.ගැ.ස.
2. පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස.
3. දිස්ත්‍රික් ලේකම්, රත්නපුර/කෑගල්ල - කරු. දැ.ගැ.ස.
4. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, සබරගමුව - කරු. දැ.ගැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස.
6. පළාත් සභා සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් - කරු. දැ.ගැ.ස.
7. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. දැ.ගැ.ස.
8. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. දැ.ගැ.ස.